# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 ජූනි මස 30 වන දින

## II වන කොටස

## අතිරේකය

(2023.07.04 දින නිකුත් කරන ලදී)


# සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)

**2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එමගින් එම උපලේඛනයේ Iඅ කොටස යටතට නිදහස් කරන ලද ද්‍රව්‍ය ලෙස 25, 26, 27, 28 සහ 29 යන අයිතම එකතු කිරීමත්, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද නිසා විදුලි මිලෙහි සිදුවන විචලනය වළක්වාලීම සහ සැක දුරු කිරීම සඳහා II කොටසේ 1 වන අයිතමය සඳහා වෙනස් වචන යෙදීමත්, II කොටස යටතට නිදහස් කරන ලද සේවයක් ලෙස 24 වන අයිතමය එකතු කිරීමත් සිදු වේ.

## සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)

එල්.ඩී.—ඕ. 54/2022

### 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක   දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2022 අංක 25 දරන පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**2.** 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි Iඅ කොටසෙහි-

(අ) 23 වන අයිතමයෙහි "එකී ද්‍රව්‍ය සපයන තාක් දුරට එකී ද්‍රව්‍ය ; සහ" යන වචන වෙනුවට, "එකී ද්‍රව්‍ය සපයන තාක් දුරට එකී ද්‍රව්‍ය" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) 24 වන අයිතමයෙහි "යන්ත්‍රෝපකරණ හෝ උපකරණ." යන වචන වෙනුවට, "යන්ත්‍රෝපකරණ හෝ උපකරණ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) 24 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"25. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බද්දට යටත් වන සහ රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබූ ආනයනය කරනු ලබන යම් මෝටර් රථයක්;

26. වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන් විසින් භාවිතා කරනු ලබන උපකරණ;

27. 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 15 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරනු ලබන තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවට බැංකුවක් හරහා ප්‍රේෂණය කරනු ලබන විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීමට, කපා ඔපදමා ප්‍රතිඅපනයනය කිරීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන, රළු පිරිසකසනු නොලැබූ මැණික් ගල්;

28. තීරු බදු රහිත වෙළෙඳසැල්වල විකුණනු ලබන යම් ද්‍රව්‍යයක් ; සහ

29. දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද වී වලින් නිෂ්පාදිත සහල්.”.

(2) එහි II කොටසෙහි-

(අ) 1 වන අයිතමය වෙනුවට, පහත අයිතමය ආදේශ කිරීමෙන්:-

“1. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බෙදාහැරීමේ බලපත්‍රයක් දරනු ලබන යම් තැනැත්තකු විසින් විදුලි බලය සැපයීම හැර විදුලි බලය උත්පාදනය කිරීම සහ විදුලි බලය සැපයීම;”;

(ආ) 22 වන අයිතමයෙහි, “සපයනු ලබන සේවා; සහ” යන වචන වෙනුවට, “සපයනු ලබන සේවා;” යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) 23 වන අයිතමයෙහි “සපයනු ලබන යම් සේවාවක්.” යන වචන වෙනුවට, “සපයනු ලබන යම් සේවාවක්; සහ” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඈ) 23 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"24. 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 97 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රයක් දරනු ලබන යම් සාමාන්‍ය අලෙවි නියෝජිතයකු විසින් සපයනු ලබන සේවා.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.